වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசன மற்றும் நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சு
MINISTRY OF IRRIGATION AND WATER RESOURCES & DISASTER MANAGEMENT

කාර්යාලය / அலுவலகம் / Office } 0112665170

විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை.
Vidya Mawatha, Colombo 07, SRI LANKA
e-mail - info@disastermin.gov.lk

ෆැක්ස් / பெக்ஸ் / Fax } 0112665170


මගේ අංකය / எனது இல / My No. } NDRSC/02/04/05/01

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2018.07. 26

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>හදිසි ආපදා තත්ත්වයන් හේතුවෙන් හානියට පත් නිවාස හා දේපළ හානි තක්සේරු කිරීම</u>

'හදිසි ආපදා තත්ත්වයන් හේතුවෙන් හානියට පත් නිවාස හා දේපළ හානි තක්සේරු කිරීම' යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අංක අමප/18/0471/715/005 හා 2018.06.12 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා බැඳේ.

02. ඒ අනුව වාරිමාර්ග සහ ජලසම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ස්වාභාවික ආපදා සඳහා වූ රක්ෂණාවරණ වැඩසටහන සහ නායයෑම් හා නායයෑම් අධි අවදානම හේතුවෙන් පදිංචි ස්ථානයෙන් ඉවත් කරන ජනතාව නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ පහත එක් එක් අවස්ථාවන්හිදී රාජකාරී ඉටුකරන නිලධාරින් සඳහා පහත සඳහන් දීමනා ලබාදීම අනුමත කරමි.

| # | දීමනා හිමිවන වැඩසටහන | දීමනා හිමිවන නිලධාරීන් | දීමනා | කොන්දේසි |
|---|---|---|---|---|
| 01 | ජාතික ස්වාභාවික ආපදා සඳහා වූ රක්ෂණාවරණ වැඩසටහන | හානියට පත් නිවාස හා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල හානි තක්සේරු කිරීම සඳහා පත්කරන ලද හානි තක්සේරු කිරීමේ කමිටුවල සාමාජිකයන් | එක් නිවසක් හෝ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථානයක් පරීක්ෂාවට ලක් කර තක්සේරුව ලබාදීම වෙනුවෙන් හානි තක්සේරු කමිටුවේ එක් නිලධාරියෙකුට රු.100ක දීමනාවක් ලබාදීම. | මෙම දීමනාව උපරිම කමිටු සාමාජිකයන් තිදෙනෙකුට මෙම කාර්යය සඳහා එදින වෙනත් අමතර දීමනාවක් ලබානොදීමේ පදනම මත හිමි වේ. |
| 02 | | තක්සේරු කමිටුවේ සාමාජිකයන් නොවන එහෙත්, හානි තක්සේරු අයදුම්පත් යොමුකිරීමේ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ වන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරින් සඳහා | නිලධාරින් සියළුදෙනා අතර අනුපාතිකව බෙදීයන පරිදි එක් ආකෘති පත්‍රයකට අදාළව තක්සේරු අයදුම්පත් යොමු කිරීමේ මුළු ක්‍රියාවලියම සඳහා රු.100ක දීමනාවක් ලබාදීම. | මෙම කාර්යය සඳහා එදින වෙනත් අමතර දීමනාවක් ලබානොදීමේ පදනම මත මෙම දීමනාව හිමි වේ. |

| | | | | |
|---|---|---|---|---|
| 03 | ගංවතුර, නායයෑම් හා නායයෑම් අධි අවදානම හේතුවෙන් පදිංචි ස්ථානයෙන් ඉවත් කරන ජනතාව නැවත පදිංචි කිරීමේ වැඩසටහන (අමප/17/1216/715/017 හා 2017.06.27 දිනැති හා අමප/17/2340/715/017-I හා 2017.10.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ක්‍රියාත්මක වන නැවත පදිංචි කිරීමේ වැඩසටහන) | ව්‍යාපෘති ආරම්භ කරන ලද දිස්ත්‍රික්කවල ඉදිකර අවසන් කෙරෙන එක් නිවසක් වෙනුවෙන්, ඒ සඳහා නිර්දේශ ලබාදීමට සෘජුවම මැදිහත් වන නිලධාරින් සඳහා | 1. තාක්ෂණික නිලධාරිට - රු.300/-<br>2. ආපදා සහන සේවා නිලධාරිට - රු.100/<br>3. මෙම කාර්යය සඳහා සම්බන්ධ වන ප්‍රාදේශීය ලේකම්වරුන් හා කාර්යාල නිලධාරින් අතර අනුපාතිකව බෙදීයන පරිදි රු.200/-ක දීමනාව ලබාදීම. | මෙම නිලධාරින්ට හිමිකම් ඇති වෙනත් දීමනාවන් වලට අමතරව විශේෂ දීමානවක් වශයෙන් ලබාදීමට. |

03. මෙම දීමනා ගෙවීමේදී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක මාණ්ඩලික නිලධාරින් හැර අනෙකුත් නිලධාරින් සඳහා ගෙවීම් අනුමත කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙතද, ප්‍රාදේශීය ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරින් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරින් වෙත ගෙවීම් අනුමත කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම් වෙතද, පැවරේ.

04. ඉහත සඳහන් උපදෙස් අනුව මෙම දීමනාව ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ සමඟ අමුණා ඇති ආකෘතිය මඟින් එක් එක් ආපදා අවස්ථාවන් සඳහා වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් කරන මෙන් කාරුණිකව දන්වන අතර ගෙවීම් කිරීමේදී ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට අනුකූලව ගෙවීම් කටයුතු කරන ලෙසටත් අදාළ රාජකාරී කටයුතුවල ඵලදායී ලෙස නිරත වූ බවට ඔබ විසින් සෑහීමකට පත්වන්නේ නම් පමණක් ගෙවීම් කටයුතු කරන ලෙසටත් වැඩිදුරටත් දන්වමි.

ඉංජිනේරු.එන්.ඒ.සිසිර කුමාර
ලේකම්
වාරිමාර්ග සහ ජලසම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

<u>පිටපත්:</u>

1. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.

## හදිසි ආපදා තත්ත්වයන් හේතුවෙන් හානියට පත් නිවාස හා දේපළ හානි තක්සේරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම

දිස්ත්‍රික්කය : ..........................................................................
ආපදාව : ..........................................................................
ආපදාව සිදුවූ වර්ෂය හා මාසය : ..........................................................................
වැඩසටහන : ..........................................................................

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | තනතුර | ................. මාසය සඳහා | | ................. මාසය සඳහා | | අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|---|---|---|---|---|
| | | | නිලධාරීන් ගණන | අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය (රු) | නිලධාරීන් ගණන | අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය (රු) | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

නිර්දේශ කළේ:-

අත්සන :..................................................
දිස්ත්‍රික් ලේකම් :..................................................
දිනය :..................................................